# ජනමාධ්‍ය අමාත්‍යංශය

## භෞමික රූපවාහිනී විකාශන ව්‍යාපෘතිය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය

## බඳවා ගැනීම්

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු), තාක්ෂණ නිලධාරී යන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ, විදේශ මූල්‍යයන ව්‍යාපෘතීන්හී කටයුතු කිරීමේහිලා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

රූපවාහිනී විකාශන ක්ෂේත්‍රයෙහි පවත්නා ගෝලීය ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි දේශීය ප්‍රතිසම රූපවාහිනී විකාශන ජාලය අංකිතකරණය කිරීම සඳහා වන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත පැවරී ඇත. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) ස්ථාපිත කර ඇති අතර එය මෙම අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

## නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු) -01

**වගකීම**

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු) විසින් තම තනතුරට අදාලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදුකරන කටයුතු සඳහා සෘජුවම ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වගකිව යුතු වේ.

**සුදුසුකම්**

ඉලෙක්ට්‍රොනික හා ජන සන්නිවේදන ඉංජිනේරු විද්‍යා හෝ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ඕනෑම අදාල ක්ෂේත්‍රයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධිත සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සාර්ථකව නිම කිරීම

සහ

අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 06ක පළපුරුද්ද ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 13ක පළපුරුද්ද

හෝ

අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයකින් ලබාගත් ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය (Corporate Membership) හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සමඟ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05ක පළපුරුද්ද ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 11ක පළපුරුද්ද

හෝ

පශ්චාත් උපාධි සුදුසුකම් හා අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය (Corporate Membership) හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සමඟ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක වසර 04ක පළපුරුද්දක් ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 09ක පළපුරුද්දක් සහිත විය යුතුය.

# තාක්ෂණ නිලධාරී -01

**වගකීම**

තාක්ෂණ නිලධාරී තනතුරට අදාළව පවරනු ලබන රාජකාරි සඳහා වගකිව යුතු අතර ක්‍ෂණිකව හෝ නිසි දැනුම් දීමක් මත රටේ ඕනෑම තැනක මෙම තනතුරට අදාළ වගකීම් ඉටු කිරීමට තෝරාගන්නා නිලධාරියා බැඳී සිටී.

**සුදුසුකම්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 7)

**හා**

අදාළ ක්ෂේත්‍රයෙහි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු වසර 03ක සේවා පලපුරුද්ද

**හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්, කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද අදාළ ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 6)

**සහ**

අදාළ ක්ෂේත්‍රයෙහි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු වසර 08ක සේවා පලපුරුද්ද

## වෙනත් විස්තර

**පාරිශ්‍රමිකය / වේතනය**

අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ගෙවීම් කරනු ලැබේ.

**වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 55ට අඩු විය යුතුය.

**අනෙකුත් සුදුසුකම්**

සෑම අයදුම්කරුවකුම,

i. ශ්‍රී ලාංකේය පුරවැසියකු විය යුතුය.
ii. තනතුරෙහි රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මනා කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

උක්ත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් ජීව දත්ත විස්තරය ද, සුදුසුකම් සහ පළපුරුද්ද සහතික/සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන ද, මෑතකදී ගත් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ද සමඟ ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය, 163, ඇසි දිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් (අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම් කෙළවරේ ඉහළ සඳහන් කළ යුතුය) හෝ **cm@media.gov.lk** ඊමේල් ලිපිනයට 2021.11.05 වන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි එවිය යුතුය.

ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය